ජගත් ජේ එදිරිසිංහ

# කටු 20

## අවසාන කොටස

නිල් මහනෙල් මල් කීපය මළසුන මත තැබූ මදාරා බොහෝ වේලාවක් වැඳගෙන සිටියාය. තමා වටා බොහෝ පිරිසක් සිටින බවක් ඇයට නොදැනුණි. ප්‍රාතිහාර්ය පිළිබඳ විශ්වාසයක් නැති වුව ද එල්ලෙන්නට හැකි, එල්ලෙන්නට ඇති, සෑම පිදුරු ගසකම පවා එල්ලෙන්නට ඇය සිත හදා ගෙන සිටියා ය. ඇය පැතුවේ එකම පැතුමකි. ඉක්මනින් විදුලට සුවය ලැබේවා යන්න ය.

මදාරා නුවර ආවේ ඊයේ සවස ය. ආදිවාසී නායකයන් හා සාකච්ඡාව සංවිධානය කර තිබුණ ආකාරය ඇගේ සිත ගත්තේය. ඇයට දැනගන්නට අවශ්‍ය වූ සහ තහවුරු කරගන්නට අවශ්‍යව තිබූ බොහෝ කරුණු සාකච්ඡාවට ගන්නට හැකිවීම ඉතා වැදගත් විය.

සංවර්ධන ක්‍රියාදාම හේතුවෙන් සිය පාරම්පරික ගම් බිම් අහිමිව යාමෙන් සංස්කෘතික වශයෙන් තමන් පත්ව සිටින කණගාටුදායක තත්වය පිළිබඳව අතිශය ආවේගශීලීව කරුණු දැක්වූ නිල්ගල ආදිවාසියා ගේ අදහස් මදාරා ගේ අධ්‍යයනය සම්බන්ධයෙන් ඉතා වැදගත් විය.

"මෙතන තියෙන්නෙ මේ මිනිස්සුන්ට කැලේ අහිමි වීම කියන කාරණය විතරක් නෙවෙයි මදාරා... හුඟක් අය ඒක තේරුම් ගන්නෙ නැහැ" මදාරාට සහය වෙමින් සිටි ව්‍යාපෘති නිලධාරියා කීවේ ය. "..මිනිස්සුන්ව ගහ කොළ වගේ උගුලලා තැනින් තැන ගිහින් හිටවන්න බැහැ"

සිය සිතේ වූ ව්‍යාකූලත්වය මත සිය මෙහෙය නිසි ලෙස නිමා කරන්නට හැකිවී ද යන ගැටළුව මුළු කාලය තුළ ම මදාරා ගේ සිතට වද දුන්නේය. චිත්ත ඒකාග්‍රතාව බිඳ දමමින් දුව යන සිත නැවතෙන්නේම විදුල අසල ය.

මේ ගමන එන්නට සිටියේ විදුල හා සමගින් ය. බලාපොරොත්තු එලෙසින් ම ඉටු නොවේ. තමාට අත දුන් මිනිසා අසරණයකු ලෙසින් රෝද පුටුවක සිටින්නේය යන්න සිහිපත් වන විට සිතට දැනෙන වේදනාව විශාල ය. උදෑසනින් දළදා මාළිගාවට ආවේ මලක් පුදා ඔහුට සුවය පතන්නට ය. එයින් අවම වශයෙන් විඩාපත් තම සිතට හෝ සහනයක් ලැබෙනු ඇතැයි ඈ සිතුවාය.

සිය ජංගම දුරකතනය අත් බෑගය තුළ කම්පනය වනු මදාරාට දැනුණි. දුරකතන තිරය මත දිස්වන්නේ සිසිර කුලසේකර ගේ අංකයයි.

"ආරංචි වුණා ද?" ඔහු වැල් වටාරමින් තොරව කෙළින් ම අසයි.

"මොකද්ද..?"

නිරාශා ගෙය පිටුපස වූ තුරු සෙවණේ විදුල ගේ රෝද පුටුව නවතා තබා බලා සිටියාය. පහළ වෙල් යාය හරහා හමා එන මඳ සුළඟ මෙතැනට හොඳින් දැනෙයි. ඒ හා දැවටී ගලා යන සේපාලිකා මල් සුවඳ හොඳින් ම හඳුනාගත හැකිය. විදුල මහත් කැමැත්තකින් ඒ සුළඟ විඳගන්නේ යයි ඇයට සිතුණි. වත්ත පුරා ඉගිලෙමින් සිටින දෙමළිච්චන්ගේ කිචි බිචිය කරච්චලයක් යයි දැන් ඇයට නොසිතෙයි. ඔවුන් නොසිටියා නම් මේ මූසල නිහඬතාව බිඳින්නේ කවුද?

විදුල සිටින්නේ දෑස් පියාගත්වන මය. නමුත් මුහුණ පුරා ඇඳී ඇත්තේ සහනයක සේයාවක් යයි ඇයට සිතෙයි. එය මායාවක්දැයි සැකයක් ඇති නොකරගෙන සිටින්නට ඇයට අවශ්‍ය විය. විටෙක සත්‍යයට වඩා මායාව සුවදායකය. ඒ සුවදායක බවෙහි ගැලී සිටීම පහසු යයි නිරාශා වටහාගෙන සිටියා ය.

ඇය බිමෙන් අසුලා ගත් ගල් කැටයක් ඔහු අත තබයි. එය අත තබාගත්වන ම ඔහු ඇගේ මුහුණ බලයි.

ජීවිතය අපැහැදිලි බියකරු සෙවණැල්ලකින් වැසී යනු ඇතැයි සිතෙන මොහොතක කණාමැදිරි එළියක් වුව මහමෙරක් සේ වටින්නේ ය. වාලුකා කාන්තාරයක් මැද තෘණ දල්ලකට ඇත්තේ කොපමණ වටිනාකමක්ද? වටිනාකම් තීරණය වන්නේ අවස්ථාවටත් පරිසරයටත් සාපේක්ෂව නොවේද?

නිරාශා විදුල වරින් වර ඔහුගේ මේසය ඉදිරියේ වාඩි කර තැබුවා ය. ඔහු මේසය මත වූ පොත් පත් අතපත ගාමින් පෙරළමින් සිටියේ ඒවා කියවන්නට උත්සාහ ගන්නාක් මෙන්ය. වරකෙ ඔහු මේස ලාච්චුවේ වූ සිගරට් පෙට්ටියත් ගිනි පෙට්ටියත් අතට ගත්තේ ය. පෙට්ටියෙන් ගත් සිගරට් මේසය මත පෙළට තැබුවේ ය. ගිනි පෙට්ටියෙන් ගත් ගිනි කූරු පෙට්ටියේ ගටා දල්වන්නට උත්සාහ කළේ ය. දැල් වූ ගිනිකූරු අතේ තබාගෙන බලා සිටියේ ය.

"පිස්සා.. අත පුච්චගන්නද හදන්නෙ..?" ඇය අසන තෙක් ම, ඔහු අතින් ගිනිපෙට්ටිය ගෙන නැවත මේස ලාච්චුවට දමන තෙක් ම, ඔහු ඒ ගිනිකූරු සමග ක්‍රීඩා කළේ ය.




මල් සුවඳත් හඳුන්කූරු සුවඳත් එක්වූ සුළඟ ගත පමණක් නොව සිත ද සුවපත් කරන්නේ යයි මාලිගාවෙන් පිටවී වැව දෙසට ඇවිද එන අතර ඇයට සිතුණි. වලාකුළු බැම්ම අසළ නැවතුණ මදාරා අරමුණකින් තොරව දිය රැළි දෙස බලා සිටියා ය. මෙතැනින් ඔබ්බට යා යුතු ගමන පිළිබඳ නැවත තක්සේරුවක් කළ යුතු යයි ඇගේ සිත කීවේ ය. ඒ ගමන සුව පහසු එකක් නොවනු ඇති බව ඇය දනියි. එසේ වුව ද සුබවාදී වීම වඩා බුද්ධිමත්ය. සැඩ සුළඟට රූස්ස ගස් බිම ඇද දැමිය හැකි ය. එසේ වුව ද ඒ ගසින් ගිලිහී යන බීජ ඉතා ඉක්මණින් ප්‍රරෝහණය වී නව පරමාපරාවක් බිහි කරනු ඒ සුළඟට වැළැක්විය නොහැකි ය. අවශ්‍ය වන්නේ කාලයට ඉඩ දී බලා සිටීම පමණකි.

"ඊයෙ රෑ සූරියබණ්ඩාර ඇක්සිඩන්ට් වෙලා.."

"ඇක්සිඩන්ට් වෙලා..?"

"ඔව්.. වෙනින් වාහනයක්.. ට්‍රක් එකක් වගේ ලොකු වාහනයක් මිනිහගෙ වාහනේ හප්පගෙන ගිහින් කියලයි කියන්නෙ.. හරියට දැකපු කෙනෙක් නැහැ"

"අමාරුද..?" ඇසිය යුතු පැනය එය වුවත් මදාරා එය නෑසුවා ය. එහෙත් සිසිර කුලසේකර දුන්නේ ඇයට දැනගන්නට අවශ්‍යව සිටි පිළිතුර ය.

"නැතිවෙලා.. එතනම"

000000000000

"විසිකරන්න.." ඈ කියයි. ඔහුට එය වැටහුණා සේ ය. සිය අත තිබූ ගල්කැටය ඔහු ඈතට විසි කර දමන්නට වෑයම් කළේය. විශාල දුරක් නොගියද ඒ උත්සාහය අපූරුය. ඔහු ඇය කියූ දෙය වටහා ගැනීම පමණක්ම සෑහීමකට පත්වන්නට ප්‍රමාණවත් ය. ඈ නැවතත් ගල්කැටයක් ඔහුගේ අත මත තැබුවා ය. මෙවර ඔහු එය විසි කරන්නේ කලින් වතාවට වඩා විශ්වාසයකින් ය. බොහෝ දුරක් යන ගැල්කැටය පතිත වන්නේ දෙමලිච්චන් රැන අසළට මය. උන් එරකවරම කෑ ගසමින් ඉගිලෙන්නේ විසල් හඬක් නගමින්ය. ඒ නාදය විදුල ගේ මුවේ අපූරු සිනාවක් මවයි. ඔහු සිනාසෙයි. නිරාශා දෑසින් කඳුළු වගුරුවමින් ඔහු දෙස බලා සිටියා ය.

ඔහුගේ දෑස් දීප්තියෙන් බැබළෙනු ඇයට පෙනුනි. ඒ දෑස් තුළ තේරුම් ගත නොහැකි යම් සසැළීමක් ඇතැයි ඇයට සිතුණි. නිවසේ අන් සෑම තැනකට ම වඩා ඔහු මේ කාමරය ප්‍රිය කරන්නේ යයි ඔහුගේ ඉරියව් පෙන්නුම් කළේය.

විටෙක නිරාශා කාමරයට එන විට විදුල ඔහුගේ මේසයට මුහුණ තබා ගත්වන ම නින්දක වැටී සිටියේ ය. ඔහුගේ මුහුණට යටවී තිබූ තිර නාටක පිටපත මත තැවරී තිබූ තෙතමණය ඇගේ සිතට ඇතුල් කළේ කුතුහලයකි. ඒ ඔහුගේ කඳුළු නොවේ ද? ඈ ඉතා සීරුවෙන් තිරනාටකය ඉවතට ඇදගත්තා ය. වඩා ළං වී බැලූ ඇයට ඔහුගේ කොපුල් මත ඇසින් ගලා විත් වියළී ගිය කඳුළක සේයාව හොඳින් දැක ගත හැකි විය. ඒ කඳුළ ඇගේ සිතේ ඇති කළේ